

# ආදරයේ රුවන් වැකිය

මනුෂ්‍යත්වය උගසට තබන මුදලට සියල්ල වෙන්දේසි කරන සංවේදීතාව ගිලිහුණු කෙනෙකු ගේ දුකක් නොහඳුනනා තරුණ පරපුරක් බිහි වී ඇත්තේ කාගේ වරදට ද යන්න විමර්ශනය කළ යුතු කරුණකි.

කාලයකට පෙර මා අසා ඇති මා බෙහෙවින් ප්‍රිය කරන රුවන් වැකියක් තියෙනවා. ඒ වෙන කිසිවක් නෙවෙයි. ඒ රුවන් වැකිය තමා 'ජීවිතය ශක්තිමත් වන්නේ අහිමි වූ ආදරයක් තුළිනි' ඉතින් ඒ වැකියේ ඇත්ත තත්ත්වය කුමක් වුවත් අහිමි වූ ආදරයක් තුළින් ජීවිතය සාර්ථක කර ගන්නා මිනිසුන් හා ජීවිතය අසාර්ථක කර ගන්නා මිනිසුන් මා එක ලෙස ම දැක තිබේ. සත්‍යතාව කුමක් වුවත් අපට අතිශයින්ම වුවමනා කරන සමාජ උත්තමාංගයකි, සැබෑ ආදරය. ආදරයත්, ජීවිතයත් ජීවිතයත් සාර්ථකත්වයත් අතර ඇත්තේ ගසට පොත්තත් පොත්තට ගසත් මෙන් අවියෝජනීය බැඳීමක් බව සත්‍යයකි.

විවිධාකාර විෂමාකාර මිනිසුන් වෙසෙන කුරිරු සමාජයක් වර්තමාන ලෝකය අපට උරුමකර හමාර ය. මනුෂ්‍යත්වය උගසට තබන මුදලට සියල්ල වෙන්දේසි කරන සංවේදීතාව ගිලිහුණු කෙනෙකු ගේ දුකක් නො හඳුනනා තරුණ පරපුරක් බිහි වී ඇත්තේ කාගේ වරදට ද යන්න විමර්ශනය කළ යුතු කරුණකි. මතුපිටින් මනස්කාන්ත ලෙස දෘශ්‍යමාන වන අනර්ඝ ප්‍රතිරූපය තුළ සැඟවී සිටින තිරස්චීන සත්ත්වයා හා මිනිස්කමින් පිරිපුන් සැබෑ මිනිසා කවුරුද යන්න වටහා ගැනීමේදී සමාජය පිළිබඳ තීක්ෂණ බුද්ධියකින් වරක් දෙවරක් නොව සිය දහස්වරක් සිතිය යුතු ම ය.

කිරි වෙනුවට ගොම සොයමින් යන සමාජයක අතරමං වුණු තරුණ හිත්වලට සැබෑ ආදරයේ මිනිස්කම් වටහා ගැනීමට නොහැකි ව ආශාවන් පසුපස හඹා ගොස් හති වැටී ඇත. එහෙත් සරසවි සිසුවා යනු මානුෂීය චින්තාවක් ඔස්සේ සිත හැසිරවිය හැකි තරුණ ජීවයෙන් පරිපූර්ණ පුද්ගලයෙකි ය යන්න කෙනෙකුට සිතිය හැකි ය. එය සදාතනික සත්‍යයදැයි තවෙකකුට තර්ක කළ හැකි ය. එහෙත් එය මාහැඟි අදහසක් පමණකි.

සරසවි භූමිය තුළ ජීවිතය විඳින ආදරණීය තරුණ සිත අපි අප ගේ දුර්වලකම් අවබෝධ කර ගැනීමට වුවමනාවක් උනන්දුවක් නො දක්වන නමුත් අන් අය ගේ එවැනි අඩුපාඩුකම් ගැන නම් සිතාසෙන්නට පෙළඹෙමු. එය අපේ දරුණු දුර්වලකමක් බව කිව යුත්තක් නොවේ. මේ මතයට එක් විද්වතකු මෙවැනි ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. 'අනෙක් අය ඔබට සිනාසීමට පෙර ඔබ ඔබට ම සිනාසෙන්න' මෙකී අදහස ගරු කොට සලකන අපට ඉහත කී දුර්වලතාව මඟ හරවා ගත හැකි ය.

තමා ගේ 'ඇදකුද' ගැන නො සොයා නො බලා අනුන් ගේ අඩු ලුහුඬුකම් සෙවීම බොහෝ අය ගේ පුරුද්දකි, එම වරද නිවැරදි කර ගැනීම සඳහා චීනයේ මුනිවරයකු වූ මහා දාර්ශනික කොන්ෆියුසියස්තුමා උපදෙස් දෙන්නේ මෙසේ ය. 'ඔබේ දොරකඩ කැළිකසල ගැන පැමිණිලි නො කරන්න'. මෙය වටහාගත් තැනැත්තාට තම දුර්වලතාවන් මඟ හරවා ගත හැකි යැයි තරයේ විශ්වාස කරමි.

විශේෂයෙන් ම මහා දාර්ශනික සොක්‍රටීස් තරුණ පරපුරේ චින්තන ශක්තිය දියුණු කිරීමේ අධිෂ්ඨානයෙන් හා සිතුවිලි නව මංගකට මුහුකිරීමේ අරමුණින් ප්‍රකාශ කර ඇත්තේ මෙවැන්නකි.

'මා දන්නේ එක් දෙයක් පමණි. එනම් මා කිසිවක් නො දන්නා බවයි' ඒ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයා තමා ගැන සිතුවේ එතරම්ම නිහතමානී ලෙස නම් සාමාන්‍ය තරුණ තරුණියන් වන අපි කෙතරම් නිහතමානී විය යුතු ද?

එලෙසින් මානුෂීය ආදරය තුළින් ජීවිතය සාර්ථක කර ගැනීමට නම් ඉවසීමේ ගුණය මෙන් ම උපේක්ෂාව තිබිය යුතු ය. එය ඉබේ වැඩෙන්නක් නො ව අප සංවර්ධනය කරගත යුතු දෙයකි. ජීවිතය තුළ අපට සිහින ඇත. අපි ඒ සිහින තුළ ජීවත් වන්නෝ වෙමු. මේ සිහින කඩා වැටීමට එක් තත්පරයක් වුව ද ප්‍රමාණවත් ය. එකී ජීවිතයේ ගෙවන හැම තත්පරයක්ම අවබෝධයෙන් ගත කරන්නේ නම් තරුණ පරපුර අද මෙලෙස සිටින්නේ නැත. එවිට සැබෑ ලෙස ම ජීවිතය විඳිය හැකි ය.

ඔබ මොහොතක් සිතන්න. අතීතය අමතක කළ තැනැත්තන්ට සාර්ථක වර්තමානයක් ද අනාගතයක් ද නැත. එය සත්‍යයකි. එහෙත් අතීතය ගෙවී ගොස් ය. එය අපට වෙනස් කළ නොහැකි ය.

අනාගතය ඇත්තේ ඉදිරියට ය. එය සුළු වශයෙන් හෝ හැඩගස්වා ගැනීමට අපට පුළුවන. එසේ ජීවිතයේ දුකේදීත් සැපේදීත් නොසැලී සිටින්න. එය පුරුදු වන්න. එවැනි පුද්ගලයෝ සැබෑ ශ්‍රේෂ්ඨයෝ ය. ඔබට එවැනි ශ්‍රේෂ්ඨයන් විය හැකි ය.

රිචඩ් බැච් යන විචාරකයා ආදරය ගැන මෙවැනි අදහසක් හෙළිදරව් කරයි. 'ආදරය යනු අපි වුවමනා කරන යම් කෙනෙකුට අප අවශ්‍යය යන හැඟීම නිසා ඇතිවන්නක් ය. එසේ ම සැබෑ ආදරය සෙමින් ලිස්සා නොයයි. එකී සැබෑ ආදර අන්දරයට කිසිදා අවසානයක් නැත.' එය සැබෑ සත්‍යයක් ය' යන්න අපට පසක් කරගත හැකි ය. ඒ නිසාවෙන් ම නැවත මෙසේ කියමි. ආදරය යනු මිහිකත සේ ස්ථිරසාර වූ හැඟීමකි. එහෙත් රාගය වූ කලි සුළඟට අයිති දෙයකි. එය මනා ලෙස වටහා ගන්නා ආදරයෙන් ජීවිතය ශක්තිමත් කරයි.

මිනිස් ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කරුණු 2ක් ගැන අජ්ත්‍රා බාන් පවසයි. ඉන් පළමු වැන්න ආදරයයි. දෙවැන්න කාර්යශීලීත්වයයි. එලෙසින් ම ආදරය වූ කලී විශ්වාසය හඟවන ක්‍රියාවක් නම් විශ්වාසය ටිකක් ඇති කෙනෙකුගේ ආදරය ද ටික ය. විශ්වාසයක් නැත්නම් ආදරයක් නැත. එය මොහොතකට සිතිය යුතු ය.

සොඳුරු ජීවිතයක සුබ සිහින දකින ආදරණීය තරුණ සිත ඔබට ආදරයක් ජීවිතයත් වෙනුවෙන් දෙයක් කියමි. මතක තබා ගන්න ආදරයේ ප්‍රථම යුතුකම සවන්දීමයි. මා එසේ කියන්නේ මෙවැනි හේතුන් නිසා ය. අපට ජීවිතයට අවශ්‍ය කරන බොහෝ දේ මිලට ලබාගත හැකි ය. එහෙත් සැබෑ ආදරණීය හිතක් කිසිදා මිලට ගත නොහැකි මහාර්ඝ වස්තුවකි. එසේ ම ඔබේ ආදරය හීන නම් එහි දෝෂයන් ද වැඩි ය. එනිසාවෙන් ම ආදරණීය තරුණ සිත ඔබට මා නැවත වරක් මෙසේ කියමි. 'ආදරය යනු බෙහෙවින් ම සංවේදී ධර්මතාවකි.' දෙදෙනෙකු ගේ හමුවීම සතුටටත් වෙන්වීම ශෝකයටත් මඟ පාදන්නේ ඒ නිසා ය.

ජීවිතය වෙනුවෙන් සාර්ථකත්වය වෙනුවෙන් මානුෂීය සතුට වෙනුවෙන් ආදරය විටින් විට දැල්වෙන ඉටිපන්දමක් කර ගන්නවා වෙනුවට නිරතුරුව බැබළෙන දීප්තිමත් ගිණිසිළුවක් කර ගන්න. ■

**ඩී. එම්. ලක්ෂිකා දිසානායක**